මගේ අංකය:- ED/02/2/කා.ක.විභාග(පොදු)

පාලන අංශය
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
රාජගිරිය.

2023.05. 25

සුරාබදු ස්ථානාධිපති,
පරිගණක අංශය

<u>කාර්යක්ෂමතා කඩඉම් විභාග නිවේදන දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කිරීම</u>

මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන සුරාබදු පරීක්ෂක හා සුරාබදු සැරයන් මේජර් තනතුරු සඳහා 2023 වර්ෂයේ පළමු භාගයේ දී පැවැත්වීමට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට අදාළ විභාග නිවේදන මේ සමග ඔබ වෙත යොමු කරන අතර, එම විභාග නිවේදන දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළකිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

ජී.ජී.ජී.එන් චන්ද්‍රතිලක
පරිපාලන නිලධාරී (පාලන)
සුරාබදු කොමසාරිස් ජනරාල් වෙනුවට

සුරාබදු කොමසාරිස් ජනරාල්
ஆணையாளர் நாயகம்
Commissioner General } 3888022 3888023

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම් ප්‍රතිපත්ති හා පාලන)
மேலதிக ஆணையாளர் நாயகம் (வருமானக் கொள்கை, நிர்வாகம்)
Additional Commissioner General (Revenue Policy & Admin) } 2045050

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම් මෙහෙයුම් හා නිති ක්‍රියාත්මක කිරීම)
மேலதிக ஆணையாளர் நாயகம் (வருமான முகமைத்துவம், சட்டவலுப்படுத்தல்)
Additional Commissioner General (Revenue Management&Law Enforcement) } 2877891

ෆැක්ස් / பெக்ஸ் / Fax } 2877890

ඊමේල් / மின்னஞ்சல் / E-Mail } excisen@slt.lk

දුරකථන අංකය / தொலைபேசி எண். / Telephone No } 2045000

# ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
# இலங்கை மதுவரித் திணைக்களம்
# EXCISE DEPARTMENT OF SRI LANKA

අංක 353, කෝට්ටේ පාර ,රාජගිරිය .இல.353,கோட்டை வீதி,இராஜகிரிய.No 353, Kotte Road, Rajagiriya.

මගේ අංකය. / எனது இல: / My No. } ED/02/2/කා.ක. විභාග (පොදු)

ඔබේ අංකය. / உமது இல: / Your No. }

දිනය / திகதி / Date } 2023.05. 24

සු.කො./නි.සු.කො./ස.සු.කො./සු.අධිකාරි/
සුරාබදු ස්ථානාධිපතිවරුන් මගින්
ප්‍රධාන සුරාබදු පරීක්ෂකවරුන් වෙත

<u>ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා ඉල්ලුම්පත් කැඳවීම</u>

<u>2023 පළමු භාගය</u>

ප්‍රධාන සුරාබදු පරීක්ෂකවරුන් වෙනුවෙන් 2023 වර්ෂයේ පළමු භාගයේ දී පැවැත්වීමට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ අයදුම්පත් කැඳවීමට තීරණය කර ඇත.

02. ඒ අනුව, මෙම වාචික පරීක්ෂණය සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් නම් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලැබේ.

03. මෙම විභාගය සඳහා අනුගමනය කරන විභාග පරිපාටිය පහත දැක්වේ.

විෂය නිර්දේශය :-

උසාවි රාජකාරි, කාර්යාල පරිපාලනය, මුදල් රෙගුලාසි සහ රජයේ සැපයුම් ක්‍රියාවලිය පිළිබඳ දැනුම මැන බැලීමේ වාචික පරීක්ෂණයකි.

| විෂය | මුළු ලකුණු | සමත්වීම සඳහා ලබාගත යුතු අවම ලකුණු |
|---|---|---|
| 01. උසාවි රාජකාරි, කාර්යාල පරිපාලනය සහ මුදල් රෙගුලාසි | 100 | 40 |

04 . අයදුම් පත්‍ර ඉදිරිපත් කිරීම :-

මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව අපේක්ෂකයින් විසින් ස්වකීය අයදුම් පත්‍රය පිළියෙල කරගත යුතුය.

ඒ අනුව, පිළියෙල කරන ලද අයදුම් පත්‍රය අපේක්ෂකයින් විසින් අදාල අධීක්ෂණ නිලධාරීන් මගින් 2023.05.31 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ රාජගිරිය, කෝට්ටේ පාර, නො.353, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව, සුරාබදු කොමසාරිස් ජනරාල් වෙත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

4.1 විභාග ගාස්තු :-

(අ) පළමු වතාවට විභාග ගාස්තු අය නොකෙරේ.

(ආ) ඉන් පසු එක් එක් වතාවකට විභාගය සඳහා රු.500.00 බැගින් අය කෙරේ.

05. යම් අපේක්ෂකයෙකු අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැතිව මෙම පරීක්ෂණයට ඉදිරිපත් වුවහොත් ඔහුගේ ප්‍රතිඵල වලංගු සේ පිළිනොගැනේ.

06. සුදුසුකම් ලත් අපේක්ෂකයින්ට වාචික පරීක්ෂණය පැවැත්වෙන දිනය හා වේලාව අයදුම්පත්වල සඳහන් රාජකාරි ලිපිනය අනුව දැනුම් දෙනු ලැබේ. ඊට පෙර ලිපිනයේ වෙනසක් සිදුවුවහොත් කල් ඇතිව ඒ බව මා වෙත දැනුම් දිය යුතුය.

ජේ.එම්.එස්.එන්.ජයසිංහ
සුරාබදු කොමසාරිස් ජනරාල්

පිටපත්:-1. ප්‍රධාන ගණකාධිකාරි

2. සියළුම සහකාර සුරාබදු කොමසාරිස්වරුන්/ සුරාබදු අධිකාරිවරුන් :-

(අපේක්ෂකයින් විසින් විභාග ගාස්තු වශයෙන් ගෙවන ලද මුදල් වෙනුවෙන් පොදු 172 ලදුපතක් නිකුත් කළ යුතු අතර එසේ එකතු වන මුදල් ලංකා බැංකුවේ තැප්‍රෝබේන් ශාඛාවේ අංක 0007041628 දරණ සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ ගිණුමට බැර කර අදාල විස්තර 2023.05.31 දිනට පෙර ප්‍රධාන ගණකාධිකාරී වෙත වාර්තා කළ යුතුය. )

ආදර්ශ අයදුම් පත්‍රය

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන සුරාබදු පරීක්ෂක නිලධාරීන් සඳහා වන
කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2023 පළමු භාගය

# EFFICIENCY BAR EXAMINATION FOR CHIEF EXCISE INSPECTORS OF THE EXCISE DEPARTMENT OF SRI LANKA – 2023 FIRST SEMESTER

01. විභාගයට පෙනී සිටින මාධ්‍යය

සිංහල - 2

දෙමළ - 3

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

02. (අ) අගට යොදන නම (මුලකුරු සමඟ)

i. සිංහලෙන්:..............................................................................................

ii. ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්:......................................................................

(උදා:GUNAWARDHANA, M.G.B.S.K.)

(ආ) මුල් අකුරුවලින් හැඳින්වෙන නම්

i. සිංහලෙන්:..............................................................................................
...........

ii. ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්:......................................................................

03. කාර්යාලීය ලිපිනය

i.
සිංහලෙන්:..............................................................................................

ii. ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්:......................................................................

04. ස්ත්‍රී / පුරුෂ භාවය:

පුරුෂ - 0

ස්ත්‍රී - 1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

06. තනතුරට පත් වූ දිනය :-

වර්ෂය: | | | | | මාසය: | | | දිනය: | | | .

07. විභාගයට ඉදිරිපත් වන විෂයන්:-

| ඉල්ලීම් කරන විෂයය | විෂය අංකය |
|---|---|
| .............................................................................. | |
| .............................................................................. | |
| .............................................................................. | |
| .............................................................................. | |
| .............................................................................. | |

08. මීට පෙර මෙම විභාගයට පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. පෙනී සිට ඇත්නම්, වර්ෂය හා මාසයද සඳහන් කරන්න.

| | වර්ෂය | මාසය |
|---|---|---|
| වාචික පරීක්ෂණය | ..................... | ................... |

09. ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉල්ලා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට මට හිමිකම ඇති බවත්, ප්‍රකාශ කරමි. ප්‍රථම වතාවට මෙම විභාගයට පෙනී සිටින බව */ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවන බැවින්, අදාළ විභාග ගාස්තුව ගෙවන ලද බවත්, ඊට අදාළ ලදුපත අමුණා ඇති බවත්, ප්‍රකාශ කරමි. (* අදාළ නොවන වගන්තිය කපා හරින්න) විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් ගනු ලබන තීරණවලට මම යටත් බව ද ප්‍රකාශ කරමි.

10. විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම්,

i. ගෙවන ලද විභාග ගාස්තුව: ........................................ ii.ගෙවූ දිනය: ..........................................

iii. ගෙවූ කාර්යාලය: ..................................................... iv. ලදුපත් අංකය:....................................

| ලදුපත එක් දාරයකින් මෙහි අලවන්න<br><br>(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.) |
|---|

..............................................

අපේක්ෂකයාගේ අත්සන

දිනය:.............................

11. අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන සහතික කිරීම.

සුරාබදු කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරමි.

මෙහි විස්තර දැක්වෙන අපේක්ෂකයාට/ අපේක්ෂිකාවට, ඔහු/ඇය දක්වා ඇති මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, නියමිත විභාග ගාස්තු ගෙවූ ලදුපත මෙහි අලවා ඇති බවත්, සහතික කරමි.

..........................................................

අංශ ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව

දිනය:.............................